## කවි කොළය

# කොට්ටෝරුව ගහෙන් ගහට
# කොට කොට යනවා
# කෙහෙල් ගහට ඇන්න දාට
# හොට පැටලෙනවා

- (පැරණි බයිලා පද දෙකක්)

කොට්ටෝරුවෙක් නරි වාදන් හලන කටේ
නැග විත් සුපිරි පැජරෝ බුරුවෙකු පිටේ
දැඟලන අයුරු පැටලී රඹ කඳක හොටේ
ටී. වී. වලට වැටුණා ලොව හතර වටේ

ජනතා කෝපයේ බිලි කටුවට ඇමිණූ
මළ මූ එකට ගෙන කළතා පිරි නැමුණූ
රතු සායමින් බලු කුක්කෙකු ලෙස තෙමුණූ
සම්බාහනය වූවා බොරු දුටු ගැමුණූ

මැතිවරණයෙදි පත්වී පිළිකුලට තද
ජනතා ඡන්දයෙන් පළවා හරින ලද
අයෙකුට ඇමති පදවියකින් කෙරුව පුද
අයටත් මේක ගතහැකි පාඩමකි හොඳ

රජවරු ඉදිරියෙත් සිටි දණහිස නොනවා
ගරුතර තැන් පවා බලයට යට වෙනවා
ආචාරිය පදය සත්තුන්ටත් දෙනවා
මේ සෙල්ලම නිසා රට බල්ලට යනවා

නොසොයා හැදුණුකම වැදගත්කම තත්තේ
ආචාරිය පදය දුන් තැනකුත් ඇත්තේ
ආයතනයට නියැළුණ මේ කට යුත්තේ
මේ කුණු ගොඩෙත් කොටසක් හිමි විය යුත්තේ


ආඩම්බරෙන් පිස්තෝලය ඉනෙහි ගසා
ජාතික ඇඳුම ඇඳ මැරවර ලකුණ වසා
හිටගෙන කරන දේ ගරුතර ඇමති බොසා
දුව දුව කරති ගෝලයෝ විළිබියද නසා

කළ මැරකම් වලට පසුගිය සියළු සමේ
නැත දඬුවමක් තරවටුවක් පෙනෙන ඉමේ
අද හෙට දිනක කරදහි දුටු ගැමුණු තෙමේ
නැත පුදුමයක් රැඳුණොත් අග ඇමති කමේ

සිය වාසියට ගෙන හොඳ
හෝ නරක දෙක
රජයේ හේනෙ මාමා
වී විඳපු දුක
සැළලිහිණියාටම මෙතුමා
කෙළිය එක
දැයිවයෙ සරදමක් බව
නම් සිතිය හැක



♦ තලන්ගම ජයසිංහ
**Sri Lanka**



## Letters to the Editor කතෘට ලියුම්

# දෙවි පිහිට පැතීම වැරැද්දක්ද?
## කොල්වින් ජයසිංහට පිළිතුරක්!

ගියවර ලංකාවිත්ති කලාපයට (දෙසැම්බර්) කොල්වින් ජයසිංහ නම් මහතෙක් ලියා තිබූ **'අනේ මේ බෞද්ධයින්ද'** යන මාතෘකාවෙන් යුත් ලිපිය කියවා ඒ ගැන කෙටි සටහනක් එවමි. කරුණාකර මෙය ඔබ පුවත්පතේ පළකරන්න.

ජයසිංහ මහතා දෙවියන්ට පිංදීමත් දෙවියන් ඇදහීමත් පටලවා ගෙන ඇති බව පෙනේ. බෞද්ධයින් වශයෙන් අප කරන්නේ දෙවියන්ට පින්දීමයි. දෙවියන් අදහන්නේ හින්දු අයයි, තව ක්‍රිස්තියානි සහ මුස්ලිම් බැතිමතුනුත් ඒ අය විශ්වාස කරන දෙවියන් අදහන බව අපි දනිමු. නමුත් බෞද්ධයින් කරන්නේ දෙව්වරුන්ට පින්දී මෙලොව ජීවිතය සාර්ථක කරගැන්මට පිහිට ඉල්ලා සිටීමයි. එහි ඇති වැරැද්ද කුමක්ද? බෞද්ධ විහාරස්ථාන වල දේවාල ඇත්තේ අද ඊයේ සිට නොවේ. මා දන්නා හැටියට දේවාලයක් නැති පන්සල කොළඹ වජිරාරාමය පමණයි. අනික් සෑම බෞද්ධ සිද්ධස්ථානයක දේවාලයක් ඇත. ඒවා ඇත්තේ එන බැතිමතුන්ට පිහි-ටක්ද සිතට සහනයක් ඇතිකර ගැනීමට. එහි වැරැද්දක් නැත. වැරැද්ද බුද්ධාගම අතහැර තනිකරම හින්දු අය මෙන් දෙවියන් ඇදහීමට පෙළඹුනොත්ය. අප කරන්නේ බුදුන් වැඳ දෙවියන්ට පින්දී උන්වහන් සේලාගේ ආරක්ෂාව ඉල්ලා සිටීමයි. මට දේවාරක්ෂාව ලැබුණු වාර අනන්තයි. බුදුහාමුදුරුවන් හමුවී දෙව්වරුන් යම් ප්‍රශ්න ඇසූ බවත් ගැටළු නිරාකරණය කරගත් බවත් සූත්‍රවල සඳහන් වේ. ඒ සූත්‍ර බොරු යයි ජයසිංහ මහතා කියනවා ද? දෙවියන් කියා කොටසක් සිටින බවත් ඒ උදවියගේ බැල්ම මනුෂ්‍ය ලෝකයට ඇති බවත් පැහැදිලි ය.

ඒ ලිපියේ වූ අනෙක් කරුණ ගැන එනම් ග්‍රහයන්ගේ බලපෑම ගැන මෙය ලියමි. ජයසිංහ මහතා ග්‍රහචාරය විශ්වාස නොකලාට එය විශ්වාස කරන මිලියන ගණනක් ලොව පුරා සිටිති. තවද සිංහළ අය පමණක් නොව ලංකාවේ බොහෝ ජාතිකයෝ හඳහන් කේන්ද්‍ර විශ්වාස කරති. පෘථුවියේ වෙසෙන අපට විශ්වයේ අනෙක් ග්‍රහයන්ගේ බලපෑම නැතැයි කිවහැකිද? මගේ හඳහන බලා කියා ඇති ඵලාපල සියල්ලම හරිය. හඳහන් බලනවාය කියා බොරුකරන අයත් අනන්ත සිටින බව අප දන්නවා. ඒ ශාස්ත්‍රය නියම ලෙස හදාරා ඇති අය කියන දේ පිළිගත හැකියි. අපල ගැන කලින් දැනගත් විට ප්‍රවේශම් විය හැකියි.

අප කාගේත් අරමුණ මෙලොව ජීවිතය සැපවත්ව සහ කරදරයෙන් තොරව ගත කිරීමයි. මුලින්ම අපේ හිත අවුල් වලින් තොරකර ගත යුතුයි. එය ලෙහෙසි නැත. දෙවියන් බුදුන් විශ්වාස කරන අයට මෙලො වත් පරලොවත් සැපවත් වන බව මගේ වැටහීමයි.

♦ ප්‍රියා ද සිල්වා ගරුමුණි
**Upton Park, London E7**




**ඉරිදා** - **SUN** කාන්තිට රට නින්ද යන්නෙ නැහැයි කිව්වම කවුද යාළුවෙක් ලංකාවෙන් මියුසික් සී. ඩී. එකක් එවලා, නිදාගන්න කොට දාන්නය, ඒක අහගෙන ඉන්න කොට පොල්ලෙන් ගැහුව වගේ දන්නෙම නැතුව නින්ද යනවයි කියලා. කාන්ති කියනවා මොන නින්දක්ද? ඒක දැම්ම දවසෙ එළිවෙන කල් ඇහැ ඇරගෙන ඉඳලා. ඒ බව ලංකාවෙ යාළුවට කිව්වම එයා කියනවලු ඒ සී.ඩී. එක දාලා ටිකකින් ඕෆ් කරල දාන්නය, එතකොටය නින්ද යන්නෙ කියලා. මට මතක්වුණා ලංකාවෙ සංගීත සංදර්ශණ. ඒපැත්ත පලාතෙ කෙනෙකුට රට නිදාගන්න බැ, මළ වදේ. ඒක නැවැත්තුවමයි මිනිස්සු නිදාගන්නෙ. මේකත් මං හිතන්නෙ ඒ ජාතියෙ සී.ඩී. එකක්.

**සඳුදා** - **MON** ගිය සුමානෙ දවාලෙ අපේ ඔපීස් එකට ආතර් මාම කළුතර ඉඳන් ටෙලිපෝන් කළා ප්‍රීතිය ප්‍රකාශ කරන්න, රූපවාහිනියෙදි මර්වින් සිල්වට මිනිස්සු පාඩමක් ඉගැන්නුවට. මාම කියනවා මුළු ලංකාවෙම ඉන්න මිනිස්සු දුක් වෙනවලු. මං ඇහුව ඇයි කියලා. මර්වින්ට ගැහුවට නෙවෙයි, ඒ මිනිස්සුන්ටත් එතනට ගිහින් ඒ කුසල කර්මයට සහභාගිවෙන්න බැරි වුණාටලු. මාමත් දුක්වෙන්නෙ ඒ මොහොතේ මාමටත් එතන ඉන්න බැරි වුණාට. මං කිව්ව මාමෙ මොනව වුනත් ඒ ඇමති කෙනෙක් නේද? එහෙම ගහන එක හොඳද? කියලා. මාම කියනවා මොන බොරුද ලංකාවෙ කිසිකෙනෙක් හිතන්නෙ නෑ මර්වින් ඇමති කෙනෙක් කියලා. ඇමතිවරුන්ට ලංකාවෙ ගහන්නෙ නෑ. ඇමතිවරු ඔය වගේ රස්තියාදුකාර පහත් වැඩ කරන්නෙ නෑ කියලා.

**කුජදා** - **TUE** කැතරින් නැන්දත් පෙරේදා විස්තර ලියලා ලියුමක් එවලා තිබුණා. මර්වින්ට ඔළුව පැලෙන්න ගහල විතරක් නෙවෙයි, රතු සායම් ටින් එකකුත් මෑන්ගෙ ඔළුවට හලලා. අර වෙනදා මවාගෙන ඉන්න සිංහ පෙනුම එදා පළාතක වත් නැහැල්ලු. හමුදා හටයො මර්වින් සායම් පිටින් කාර් එකට ගෙනැත් දානකොට, නැන්ද කියනවා, දෙකේ පන්තියෙ කුමාරෝදෙ පොතේ තිබුණු තීන්ත බාල්දියෙ වැටිච්ච නරිය මතක් වුණාලු. නැන්ද කියනව මාසෙකට සැරයක් වත් කාගෙන් හරි ගුටි කනව නම් මර්වින් හැදිලා ඒවි කියලා. ඒක ඇත්ත.

**බුදදා-** **WED** පත්තරේක තිබුණා ඉන්දියාවෙ මිනිහෙක් සාපෙකින් බේරෙන්න සාස්තර කාරෙයකුගෙ ලණුවක් කාලා, බැල්ලියෙක් කසාද බැඳපු ප්‍රවෘත්තියක්. ඉන්දියාව අද තාක්ෂණය අතින් දියුණු රටක්. රොකට් හදනවා. කම්පියුටර් කොටස් නිපදවනවා. හඳට මිනිහෙක් යවන්නත් ලෑස්ති වෙනවා. සෑහෙන ගණනක් විද්‍යාඥයො ඉන්නවා. අබ්දුල් කාලම් වගේ බුද්ධිමත් ජනාධිපතිවරු. ඒ වුනාට ඒක තවම මෝඩයින්ගෙ රාජ්‍යය. සාස්තර, කේන්දර, මැජික්වලට රැවටෙන බහුතර ජනගහනයක් ඉන්නෙ. මොන හේතුවට හරි තිරිසනෙක් කසාද බඳිනව කියන්නෙ මිනිස්කමටත් නින්දාවක්. මෝඩකම කවදාවත් සනීප කරන්න පුළුවන් ලෙඩක් නෙවෙයි.

**ගුරුදා** - **THU** මහ රැජිණගෙ සුවාමි පුරුෂයා එඩින්බරෝ ආදිපාද, එහෙමත් නැත්නම් පිලිප් ලොක්කා, මහ කටකැඩිච්ච කතා කියන මහා තකතිරුවෙක් හැටියටයි හුඟක් දෙනා හිතාගෙන ඉන්නෙ. පිලිප් ලොක්කා ගැන පත්තරවල හැම තිස්සෙම පළ වෙන්නෙ කියපු විකාර කතාවක්. ඒ වුනාට ඒ අදහස වෙනස් වෙන දෙයක් ළඟකදි මතුවුණා. කවුරුත් හිතුවෙ ප්‍රින්ස් පිලිප් ඩයනා කුමරියට හතුරුකම් කරපු කෙනෙක් හැටියට. ළඟදි ඩයනා සහ පිලිප් අතරේ හුවමාරු වුණු ලියුම් වගයක් පත්‍රවල පළවුණා. දැන් පේනවා පිලිප් ඩයනාට ඉතා හිතවත්ව හිටි බව. චාර්ල්ස් ඩයනා කසාදෙ බිඳ වැටුණට එයා හුඟක් දුක්වුණු බව. ඒක පාස්සන්න කොච්චර මහන්සි ගත්තද කියන එක. ලෝකයා මෙපමණ කල් හිතූ හැටි වැරදියි.

**කිවිදා** - **FRI** කොටියි ලංකා රජයයි අතරෙ තිබුණු සටන් විරාම ගිවිසුම අහෝසි වුණාට සාම කාක්කො දුක් වෙනවා. දැන් ඔන්න ලංකාව ලේ ගංගාවක් වේවිලු. කොටි ඔන්න දැන් මිනිස්සු මරන්න පටන් ගනීවිලු. ඒ ගිවිසුම තියන කොට කොටි නිකම් හිටියද? උන් හැම දාම කළේ බෝම්බ පුපුරවලා වෙඩිතියලා කපලා කොටලා මිනිස්සු මරපු එක නේ. උන් දන්නෙත් එච්චරනේ. ලෝකෙ හතරවටින් කියපු දේවල් ලංකාව මෙච්චර කල් කළේ. ඒවයින් තඹ සතේක ප්‍රයෝජනයක් වුණේ නැහැ. කොටි තව ශක්තිමත් වුණා විතරයි. ලංකාව කරන්න ඕන ලංකාවට සුදුසු දේ. වහාම කොටි සංවිධානය තහනම් කරන්න. ඒක මුළුමනින්ම විනාස කරන්න.

**ශනිදා** **SAT** කොළඹ පුරාම සැරින් සැරේට කොටි බෝම්බ පුපුරණ කොට හමුදාවෙන් කොළඹ අවට ලොජ් වැටලුවාම උතුරෙ ඉඳලා ඊයෙ පෙරේදා ආපු දෙමළ කොල්ලො කෙල්ලො 200 කට වඩා අහුවෙලා. උඹලා මොකද මෙහේ කරන්නෙ ඇහුවම, මුකුත් නෑ අයියා අපි නිකං ආවා කිව්වලු. උඹලා කොටි සාමාජිකයො නේද? කියල ඇහුවම, උන් අහනවලු කවුද අයියා කොටි කියන්නෙ කියලා. ප්‍රභාකරන්ගෙ පොටෝ පෙන්නලා මෙයා අඳුරනවද ඇහුවම අනේ කවුද අයියා මේ පොර පිලිම්ස්ටාර් කෙනෙක්ද? කියලා බබා පාට් දානවලු.



දකුණු ඉන්දියාවේ තමිල් නාඩුවේ 34 වියැති සෙල්වකුමාර් සාපයකින් මිදෙන්නට බැල්ලියක් සරණ පාවා ගත්තේය. හිටි හැටියේ ඔහු ගොළුවී, කන් නෑසී, කොරෙකු බවට පත්විය. ඔහු වරක් කුඹුරක රමණයෙහි යෙදෙමින් සිටි බල්ලන් ජෝඩුවක් ගල්ගසා මැරුවේය. ඒ නිසා එසේ වූ බවත්, ඒ ශාපයෙන් මිදෙන්නට නම් බැල්ලියක් හා විවාහ විය යුතු බවත් ශාස්ත්‍රකරුවෙකු කීවේය. සෙල්වකුමාර්ගේ මනාලිය වූයේ යහලුවෙකුගේ සෙල්වි නම් බැල්ලියකි. නෑදෑ හිතවතුන් විශාල පිරිසක් මැද හින්දු පූසාරියෙකු ස්තෝත්‍ර කියා සාමාන්‍ය විවාහයක් විදියටම මංගල්‍යය සිදු කළේය. මනාලයා තම බලු මනාලියට සාරියක් අන්දවා මල්මාලයක් ද පැළඳවීය.

# Indian man marries a dog
## බැල්ලියක හා විවාහ වූ මිනිසා

CHENNAI, India, Nov 14, 2007 (AFP) - An Indian farmer has married his dog in a bid to overcome what he believes is a curse caused by him having stoned to death two mating dogs in his rice field, press reports said.

The 34-year-old farmer, identified as Selvakumar from Sivaganga district in the southern state of Tamil Nadu, fell on bad fortune 15 years ago after killing the dogs and hanging their carcasses from a tree. A few days later, his hearing and speech were impaired and he was unable to walk.

Doctors were clueless, but an astrologer finally told him he was cursed by the spirits of the dogs he had killed. He could undo the curse only if he married a dog and live with it, the soothsayer said.

After a long search for a 'suitable bride', Selvakumar managed to get a four-year-old mongrel bitch from a friend and had a fully-fledged Hindu wedding in front of villagers and elders, eyewitnesses said.

The canine bride, named Selvi, was adorned in a sari and flowers and brought to the temple by village women. A Hindu priest conducted the ceremony.

The reports, however, said Selvi the dog attempted to make a run for it -- apparently due to the large crowds -- but was eventually tracked down and returned to her new ' husband '.

" The dog is only for lifting the curse and he would get a real bride later ," a friend of the groom said.